**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය - 2015**

--------------------------------------

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතියක් මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති අවස්ථාවකදී හැර ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද, ආයතනයේ ආදායම් ප්‍රභවයන් කිහිපයක ආදායම ගිණුම්ගත කිරීමේදී රු.33,395,289ක වියදම් අඩු කිරීමෙන් පසු ආදායම ගිණුම් ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පොළී ආදායම ලෙස දක්වා තිබූ රු.22,110,557 ක් ශුද්ධ අතිරික්තයට අඩු කර හා සමාලෝචිත වර්ෂයේ මුදලින් ලැබූ පොළී ආදායම රු.22,160,907 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එකතු කර දැක්විය යුතු වුවත් පොළී ආදායම ලෙස රු.26,989,134 ක් අඩුකර හා එකතුකර දක්වා තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු භාණ්ඩාගාර තැන්පතු හා භාණ්ඩාගාර අතිරික්ත අරමුදල ලෙස රු. 1,627,500 ක් දක්වා තිබූ අතර, මහා භාණ්ඩාගාරයෙන් එම මුදල අයකර ගැනීමට ඉල්ලීම් කළද 2015 දෙසැම්බර් 31 දින වන විටත් අය නොවී පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.34,604,366 ක් වූ ණයගැතියන්ගෙන් සියයට 63ක් එනම් රු.21,954,769 ක් අවුරුදු 2 ත් 5 ත් අතර හා සියයට 36 ක් එනම් රු.12,291,934 ක් වර්ෂ 5ක් ඉක්මවා තිබූ අතර මෙම ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 32 කදී ලබාදී තිබූ එකතුව රු.1,582,708ක අත්තිකාරම් 2016 අගෝස්තු වන විටද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2010 වර්ෂය වන විට අවසන් කිරීමට නියමිතව තිබූ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන්ගේ ව්‍යාපෘතිය වෙනුවෙන් ලද රු. 26,294,152 ක මුදලින් රු.4,126,759 ක් සුදුසු කර්මාන්තකරුවන් තෝරා ගැනීමට නොහැකි වීම හේතුවෙන් උපයෝජනය කර නොතිබුණු අතර 2015 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. එම ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කරවා ගැනීමට හෝ මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 1998 වර්ෂයේ සිට පැවත එන රු.445,572ක් වටිනා අහරු වූ චෙක්පත් 13ක් සඳහා ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් ගෙන් ලබාගත යුතු ප්‍රකාශ ලබාගෙන නොතිබුණි.

**2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංයුක්ත දීමනා ගෙවීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන වලින් බැහැරව මිපී විද්‍යා අංශයේ නිළධාරීන් වෙනුවෙන් පැය 8ට අඩු කාලය සඳහා රු.1,200ක් ද, පැය 8ත් 12ත් අතර කාලය සඳහා රු.2,000ක්ද, පැය 28ට වැඩිනම් රු.6,000 ක් ද වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී සංයුක්ත දීමනා ගෙවා තිබූ අතර නියැදි විගණන පරීක්ෂා අවස්ථා 19 කදී ආයතන සංග්‍රහයේ විධිවිධාන ඉක්මවා රු.618,900ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මහා මණ්ඩලයේ තීරණය මත පමණක් පදනම්ව ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා, ප්‍රවාහන දීමනා, පෝෂණ දීමනා, සතිඅන්ත දීමනා හා නිළ ඇඳුම් දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේ දී පිළිවෙලින් රු.28,662,400ක්, රු.21,370,204ක්, රු.5,699,500ක්, රු.4,162,625ක් හා රු.4,717,505ක් ගෙවා තිබුණි.

(ඇ) ආයතනයේ වාහන නවතා තැබීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් ඉඩමක් භාවිතා කරනු ලබන අතර විගණිත දිනය වූ 2016 අගෝස්තු 31 වන විටත් දෙපාර්ශවය විසින් ඒ සම්බන්ධව බදු ගිවිසුමකට එළඹ නොතිබියදී 2013 වර්ෂයේ සිට වර්ෂ තුනක කාලයක් සඳහා බදු කුළී ලෙස රු.455,857 ක් ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.137,311,607 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.91,394,529 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.45,917,078 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික වියදම රු. 45,625,518 කින් වැඩිවී තිබුණ ද, මෙහෙයුම් ආදායම රු. 98,035,293 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී රු.101,032,277 ක් වූ අතිරික්තය 2014 වර්ෂය වන විට රු.91,394,529ක් දක්වා අඩු වී තිබුණද 2015 වර්ෂය වන විට රු.137,311,607ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, රජයට ගෙවන ලද බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය 2011 වර්ෂයේදී රු. 285,450,558ක සිට සමාලෝචිත වර්ෂය අවසානයට රු.463,817,651ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 3 වගන්තිය ප්‍රකාරව ආයතනයේ අරමුණු වනුයේ,

- ජාතික සහ අන්තර් ජාතික පදනම මත ප්‍රමිති පිළියෙළ කිරීම, ඒවා කලින් කල පරිශෝධනය කිරීම, වෙනස් කිරීම සහ සංශෝධනය කිරීම.
- කාර්මික හා වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද හෝ ආනයනය කරන ලද ආහාර ද්‍රව්‍ය සහ ඖෂධ ඇතුළු නිෂ්පාදන, වෙළඳ ද්‍රව්‍ය සහ ද්‍රව්‍ය, තත්ත්ව ප්‍රමිති හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනුකූල වන්නේදැයි පරීක්ෂා කිරීම සඳහා වැඩ පිළිවෙල යෙදීම හෝ පහසුකම් සැපයීම.
- සූක්ෂ්ම උපකරණ, මිනුම් ගන්නා උපකරණ සහ විද්‍යා උපකරණ පරීක්ෂා කිරීම සහ ප්‍රමාණ ශෝදනය සඳහාත් නියමිත ප්‍රමිතිවලට අනුකූල වනසේ ඒවා සම්බන්ධයෙන් සහතික නිකුත් කිරීම සඳහාත් වැඩ පිළිවෙල යෙදීම හෝ පහසුකම් සැපයීම.
- ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය සම්බන්ධ පර්යේෂණ කටයුතු කිරීමට පහසුකම් සැලස්වීම හා රසායානාගාර සහ පුස්තකාල පිහිටුවීම
- දේශීය පරිභෝජනය සඳහා වූ හෝ අපනයනය සඳහා වූ වෙළඳ ද්‍රව්‍ය, ද්‍රව්‍ය, නිෂ්පාදිත, නිෂ්පාදන සහ වෙනත් දේවල තත්ත්වය සහතික කිරීම.
- අධ්‍යාපනික, උපදේශක සහ වෙනත් මාර්ග වලින් ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම.
- ආයතනය පිහිටුවනු ලැබූ අරමුණු හා සමාන අරමුණු ඇති, ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තන්, සංගම් හෝ සංවිධාන සමග සහයෝගීතාවය සඳහා විධිවිධාන සැලැස්වීම.
- වෙළඳ ද්‍රව්‍යවල, ද්‍රව්‍යවල, නිෂ්පාදනවල, උපකරණවල, පිරි සැකසුම්වල සහ ක්‍රමවල තත්ත්වය වැඩිදියුණු කිරීමට නිෂ්පාදකයන්ගේ සහ පාවිච්චි කරන්නන්ගේ උත්සාහයන් සම්බන්ධීකරණය කිරීම වේ.

ඉහත සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා සකස් කළ ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය පිළිබඳව කරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) ජාතික ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය ජාතික ප්‍රමිත ඇති කිරීම සඳහා ජාතික ප්‍රමිති 40 ක්, ප්‍රමිති පුනරීක්ෂණය හා සමාලෝචන වැඩසටහන් 35ක් සහ ප්‍රමිති ප්‍රවර්ධන වැඩසටහන් 12ක් ඉටු කිරීමට ඉලක්ක කර තිබුණද තත්‍ය කාර්යසාධනය පිළිවෙලින් 17ක්, 27ක් හා 2ක් පමණක් වීමෙන් ඉටු නොවූ කාර්යයන් පිළිවෙලින් 23 ක් 8ක් හා 10ක් විය.

(ආ) ආර්ථිකයේ සියළුම අංශවල ගුණාත්මක ආරක්ෂණය ඉහළ නැංවීමේ අරමුණින් නිෂ්පාදන සහතිකකරණය යටතේ කර්මාන්තශාලා 425 ක් හා වෙළඳපොල නියැදි 100ක් පරීක්ෂා කිරීමට සහ සහතික 10ක් ලබාදීමට අපේක්ෂා කළද කර්මාන්තශාලා පරීක්ෂාවන් 70ක් සහ නියැදි පරීක්ෂාවන් 86 ක් සිදු කිරීමට නොහැකිවී තිබූ අතර සහතික කිසිවක් ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආර්ථිකයේ සියළුම අංශවල ගුණාත්මක ආරක්ෂණය ඉහළ නැංවීමේ අරමුණ යටතේ විදේශීය නිෂ්පාදකයන්/ පරීක්ෂණාගාර 12ක් ලියාපදිංචි කර ගැනීමට හා ආනයන පරීක්ෂණ සඳහා නව භාණ්ඩ 2ක් ඇතුලත් කිරීමට ඉලක්ක කළ ද, විදේශීය නිෂ්පාදකයන්/පරීක්ෂණාගාර 8 ක් ලියාපදිංචි කර නොතිබුණු අතර ආනයන පරීක්ෂණය සඳහා නව භාණ්ඩ කිසිවක් එකතු කර නොතිබුණි.

(ඈ) පද්ධති සහතිකකරණය යටතේ කළමනාකරණ පද්ධතියක් ප්‍රතීතනය කිරීමටද, විද්‍යාතා පද්ධති සහතිකකරණයන් 5ක් ලබා දීමට ද අපේක්ෂා කර තිබූ නමුත් ඉන් කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි.

(ඉ) කාර්මික හා වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය කිරීම ප්‍රවර්ධනය කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණක් වන අතර ඒ සම්බන්ධව සිදුකළ විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආනයනික ළදරු සබන් පරීක්ෂාව

- 2013 වර්ෂයේ සිට විදේශීය නිෂ්පාදන සමාගමකින් මෙරටට ආනයනය කරන ලද සබන් තොග කිලෝ ග්‍රෑම් 247,111කින් තොග කිලෝ ග්‍රෑම් 169,443ක් සඳහා විස්තරාත්මක පරීක්ෂාවන් සිදුකළ යුතු වුවත් එසේ නොකර spot පරීක්ෂාවන් පමණක් සිදුකර තිබුණි.

- ළදරු සබන් පරීක්ෂාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති අංක 547 : 2009 හි සඳහන් පරිදි පරීක්ෂා කළ යුතු පරාමිතීන් 6 න් Matter insoluble in ethanol, percent by mass, max; හා Chlorides, as (NACL) percent by mass, max; යන පරාමිතීන් 2 ක කිසිදු අවස්ථාවකදී පරීක්ෂාවට ලක්කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බෝතල් කළ පානීය ජලය සඳහා ප්‍රමිති ලාංඡන ලබාදීම

ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බෝතල් කළ පානීය ජලය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති අංක 894:2003 යටතේ SLS ලාංඡනය ලබා දෙන අතර බලපත්‍රයේ වලංගු කාලය අවසන් වන විට විගණන පරීක්ෂාවන් සිදු කිරීමෙන් පසුව බලපත්‍රයේ වලංගු කාලය දීර්ඝ කළ යුතුය. එහෙත් නිෂ්පාදන ආයතන 2 ක බලපත්‍ර කාලය දීර්ඝ කිරීමේ දී අදාල විගණන පරීක්ෂාවන් සිදු කිරීමකින් තොරව මාස 6 ක කාලයක් සඳහා දීර්ඝ කිරීමක් ලබා දී තිබුණි.

(iii) ආනයනික කිරිපිටි පිළිබඳ පරීක්ෂාව

- ශ්‍රී ලංකා ප්‍රමිති අංක 731:2008ට අනුව ආනයනික කිරිපිටිවල සංයුතිය සඳහා පරාමිතික 08 ක් හා ක්ෂුද්‍ර ජීවී පරීක්ෂාව සඳහා පරාමිතික 05ක් පරීක්ෂා කළ යුතු වුවත් පරාමිතීන් 3 ත් 5 ත් අතර පරාසයක් පමණක් පරීක්ෂාකර 2015 ජනවාරි සිට ජූනි මාසය දක්වා විදේශීය නිෂ්පාදකයකුගෙන් අවස්ථා 25 කදී ආනයනය කළ ඇමරිකානු ඩොලර් 6,530,430 ක් වටිනා කිලෝ ග්‍රෑම් 2,300,800 ක කිරිපිටි තොග වෙළඳපොලට නිදහස් කර තිබුණි.

- ප්‍රමිති සඳහා GL – II – 04 මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් පරිදි විදේශීය රාජ්‍ය ආයතනයක පිළිගත් අනුකූලතා සහතිකයක් ලබා ගෙන ඇති තොග සඳහා අවස්ථා 3 ට 1 ක් ලෙස පරීක්ෂාවන් කළ යුතුය. එහෙත් අවස්ථා 33කදී ආනයනය කළ ඇමරිකානු ඩොලර් 12,708,609 ක් වටිනා කිරිපිටි කිලෝ ග්‍රෑම් 4,559,554 ක් සඳහා 5ට 1 ක් වශයෙන්වත් පරීක්ෂා කිරීමකින් තොරව එම කිරිපිටි තොගය වෙළඳපොලට නිදහස් කර තිබුණි.

(iv) ආනයනික සිමෙන්ති පිළිබඳ පරීක්ෂාව

ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර 107 යටතේ සිමෙන්තිවල සම්පීඩ්‍යතා ශක්තිය 42.5 ත් 62.5 ත් අතර පරාසයක පිහිටිය යුතු වුවත් විදේශීය නිෂ්පාදන සමාගමකින් 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අවස්ථා 46 කදී ආනයනය කරන ලද ඇමරිකානු ඩොලර් 2,603,490 ක් වටිනා සිමෙන්ති කිලෝග්‍රෑම් 43,960,000 ක සම්පීඩ්‍යතා ශක්තිය 42.5 ට වඩා අඩු අගයක් ගෙන තිබුණ ද ඒවා වෙළඳපොළට නිදහස් කිරීමට ආයතනය විසින් අවසර ලබාදී තිබුණි.

(v) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ක්ෂණික පළතුරු බීම සඳහා ප්‍රමිති සහතික ලබා දීම

--------------------------------------------------------------------------------------

- පුද්ගලික නිෂ්පාදන සමාගමක ප්‍රමිති සහතික බලපත්‍රය අළුත් කිරීම සඳහා Benzoic Acid පරීක්ෂාවට අදාළ වාර්තාව ආයතනය වෙත ලැබී තිබුණේ මාස 7 කට පසුව 2015 පෙබරවාරි 24 දින වන අතර සමාගම එම පරීක්ෂණයෙන් අසමත් වී තිබුණි. එසේ වුවද බලපත්‍රයේ වලංගු කාලය 2014 දෙසැම්බර් සිට මාස 06 ක් දක්වා දීර්ඝ කිරීමට 2015 පෙබරවාරි 18 දින පැවති බලපත්‍ර කමිටුව මගින් අනුමැතිය ලබා දී තිබුණි.

- පුද්ගලික නිෂ්පාදන සමාගමක එක් වෙළඳ නාමයක් යටතේ පමණක් බලපත්‍රය අළුත් කිරීමේදී Limit For Heavy Metals සඳහා අවශ්‍ය වන පරීක්ෂණ වන Arsentc, Cadmium, Lead & Tin යන පරීක්ෂණ සිදුකිරීමකින් තොරව බලපත්‍රය අලුත්කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1969 අංක 19 දරන පරමාණුක බලශක්ති අධිකාරී පනතේ II කොටසේ 12 ඡේදයට අනුව විකිරණශීලි ප්‍රභව සම්බන්ධයෙන් බලපත්‍රයක් ලබාගත යුතු වුවත් ශ්‍රී ලංකා ප්‍රමිති 1178 : 2013 ට අනුව ගෑස් සිලින්ඩර්වල විකිරණ පරීක්ෂාව සිදු කිරීම සඳහා ආයතනය විසින් 2013 වර්ෂයේදී රු.11,992,960කට මිලදී ගත් පෝටබල් එක්ස් රේ උපකරණ සඳහා 2016 අගෝස්තු වන විටත් බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණ ද පරීක්ෂණ කටයුතු සඳහා උපකරණය භාවිතා කරන බව නිරීක්ෂණය විය.

(ආ) සුළු කර්මාන්තකරුවන් වෙනුවෙන් GMP සහතික ලබාදීම සඳහා 2012 වර්ෂයේදී අමාත්‍යාංශයෙන් රු. 947,264 ක මුදලක් ලැබී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යය අවසන් කිරීමට කටයුතු කර නොතිබුණු අතර රු. 750,981 ක ශේෂයක් ඉතිරිවී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

## 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

2013 සහ 2014 වර්ෂවලදී සැලසුම් කරන ලද වටිනාකම රු.3,424,265ක ප්‍රසම්පාදන කාර්යයන් 2ක් ඉටුකිරීම සමාලෝචිත වර්ෂය දක්වා ප්‍රමාද වී තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුවී නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත පුනරාවර්තන වියදම හා තථ්‍ය වියදම සැසඳීමේ දී අයිතම 73ක සියයට 25 සිට සියයට 100 දක්වා ඉතිරි වීම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ණයගැති හා ණයහිමි පාලනය | | ණයගැති ශේෂ අයකර ගැනීමේ ප්‍රමාදය හා ණයහිමි ශේෂ නිරවුල් නොකිරීම. |
| (ආ) සංයුක්ත දීමනා ගෙවීම් කිරීම. | (i) | සංයුක්ත දීමනා සඳහා ඉල්ලුම් කිරීමේදී ස්ථිර පදිංචි ලිපිනය හා තාවකාලික ලිපිනය වවුචර්වල සඳහන් නොකිරීම සහ ඒ හේතුවෙන් තාවකාලිකව සේවය කරනු ලබන ස්ථානයට ඇති කෙටිම දුර පිළිබඳ සලකා බැලීමකින් තොරව ගෙවීම් කිරීම. |
| | (ii) | මිරි විද්‍යා අංශයේ නිලධාරීන් සඳහා සංයුක්ත දීමනා ගෙවීමේ දී ඉදිරිපත්කරනු ලබන බිල්පත්වල නිරවද්‍යතාවය පිළිබඳ පරීක්ෂා කිරීමකින් තොරව ගෙවීම් කිරීම. |
| (ඇ) විදේශ පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ පැවැත්වීම. | | විදේශ පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී අයදුම්පත්‍ර කැඳවා ඇගයීමකට ලක්කර නිලධාරීන් තෝරා නොගැනීම. |